**නගර හා කඩවත් සතර ප්‍රාදේශීය සභාව - 2023**

**----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නගර හා කඩවත් සතර ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට නගර හා කඩවත් සතර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්‍ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී වියදම් ලෙස රු. 877,931 ක් ගෙවිය යුතුව තිබුණද. වර්ෂය සඳහා වියදම් සහ කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර නොතිබුණි.. | ඔබ විසින් පෙන්වා දුන් අඩුපාඩු සහ වැරදි අනාගතයේදී සිදු නොවනු ඇත. | ගෙවිය යුතු මුදල් ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී අනෙකුත් රාජ්‍ය ආයතනවලින් ආයුර්වේද රෝහලට පරිත්‍යාගයක් ලෙස ලැබුණු රු. 1,000,000 ක් වටිනා ඖෂධ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.. | ඔබ විසින් පෙන්වා දුන් අඩුපාඩු සහ වැරදි අනාගතයේදී සිදු නොවනු ඇත. | පරිත්‍යාග වටිනාකම් මූල්‍ය ප්‍රකාශනයේ හෙළි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු. 664,909 වටිනාකමට මිලදී ගත් භාණ්ඩ වර්ග 05 ක් අදාල ස්ථාවර වත්කම් ගිණුමට ඇතුළත් කර නොතිබුණි.. | ඔබ විසින් පෙන්වා දුන් අඩුපාඩු සහ වැරදි අනාගතයේදී සිදු නොවනු ඇත. | ස්ථාවර වත්කම්වල වටිනාකම ගිණුමට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 විගණනයට ලිඛිත සාක්ෂි නොවීම

-----------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු. 344,074,074 ක් වූ ගිණුම් අයිතම 04 ක සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය ද ඉදිරියේදී අදාළ සාක්ෂි සමඟ ඉදිරිපත් කරනු ඇත. | ලේඛන ලබා ගැනීමට පියවර ගත යුතුය |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | ------------------ | -------------------- | ------------------------ | ---------------- |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය | විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව 1990 - 2013 වකවානුවේදී ලබාදුන් රු. 2,356,250 ක අත්තිකාරම් 2019 මූල්‍ය ගිණුම් වලින් කපාහැර තිබුණි. | 2024 අවසන් ගිණුමේ අදාළ කරුණු නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 571 (1), (2), (3) | වර්ෂ දෙහකට වැඩි රු. 16,554,082 ක කල් ඉකුත් වූ තැන්පතු 75 ක් සම්බන්ධයෙන් සභාව අදාළ කටයුතු සිදුකර නොතිබුණි. | ඉදිරි කාලෙය්දී තැන්පතු නිසි කාලෙය්දී නිවැරදි කරනු ලැබේ. | ආදායම් ලෙස මාරුකිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ 31 දෙසැම්බර් 2023 .පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු 66,570,633 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු. 35,031,797 ක් විය .

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 35,967,000 | 52,318,980 | 23,967,875 | 28,351,105 | 28,516,000 | 27,405,000 | 25,467,000 | 24,750,000 |
| (ii) | කුලී | 8,007,200 | 8,550,642 | 7,289,032 | 1,261,610 | 7,247,000 | 8,367,000 | 5,443,000 | 4,365,000 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 8,406,080 | 8,181,985 | 8,181,985 | - | 6,405,000 | 2,171,000 | 2,171,000 | - |
| (iv) | වෙනත් ආදායම් | 3,542,500 | 3,346,838 | 1,260,727 | - | 13,019,000 | - | 14,391,000 | - |
| | එකතුව | 55,922,780 | 72,398,445 | 40,699,619 | 29,612,715 | 55,187,000 | 37,943,000 | 47,472,000 | 29,115,000 |

**2.2.2** **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාවේ සියලුම ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණයන් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **වරිපනම්** | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට රු. 27,030,334 ක හිඟ වරිපනම් අයකිරීමට වසර එක සිට වසර අටකට වැඩි කාලයක් දක්වා කටයුතු කර නොතිබුණි.. | අයකිරීම සඳහා ජංගම සේවාව සහ K ආකෘතියේ හිඟ මුදල දක්වා ලබා දෙනු ලැබේ. | හිඟය කඩිනමින් අයකිරීමට කටයුතු කළ යුතුයි. |

**2.2.3** **මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය පරිපාලන රීති 81 අනුව අදාළ කාලසීමාවන්හිදී ගණනය කර ඉල්ලුම් කර ලබාගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.. | මේ සම්බන්ධයෙන් අඛණ්ඩ ක්‍රියාමාර්ග ගනිමින් සිටි. | කාල සීමාවව අදාල මුද්දර ගාස්තු අයකර ගැනීමට නිසි පියවර ගත යුතුය. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෙල්ලයිමනල් ප්‍රදේශයේ පිහිටි සභාවට අයත් නේවාසිකාගාර 03 ක වසර 40 කට අධික කාලයක් පිටස්තර පුද්ගලයින් පදිංචිව සිටින නමුත් සභාව විසින් ඔවුන්ට එරෙහිව කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.. | කුලී නොගෙවන්නන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගන්න බව. | කුලී නොගෙවන්නන්ට නීතිමය පියවර ගත යුතුය. |
| (ආ) | සභාව විසින් 2017 දී CGL International ECO (Pvt) Ltd ආයතනය සමඟ එළැඹුණු ගිවිසුමේ 4.7 සහ 5.8 වගන්තිවලට අනුව අපද්‍රව්‍ය සඳහා වන කොන්ත්‍රාත්තුවේ 05 වන වසරේ සිට ආයතනයේ වාර්ෂික ලාභයෙන් වාර්ෂිකව 24 % (සෑම මසකම 02 %) ටිප් කිරීම් ගාස්තුවක් වශයෙන් | අදාල කරුණ සම්බන්ධයෙන් CGL ආයතනය වෙත දැනුම් දීමක් කර සුදුසු මුදල අයකරගනු ලැබේ. | ගිවිසුමේ වගන්තියට අනුව ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අයකිරීමට නියමිතව තිබියදී (Tipping Fee) කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | | |
| (ඇ) | වෙල්ලයිමනල් උප කාර්යාල සීමාවට අයත් ඉන්දීය ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ (IOC) ඉන්ධන පිරවුම්හලෙන් (IOC Terminal Point) ඉන්ධන ප්‍රවාහනය සඳහා බවුසර් නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අයකිරීම සඳහා 2022 වර්ෂයේදී සකස් කරන ලද බිල්පත් 100 ක සංඛ්‍යාවක් අඩංගු පොත් 50 ක් භාවිතයට නොගෙන ගබඩාවේ දක්නට තිබුණි. | පිළිතුරු සපයා නැත. | ආදායම අයකිරීමට කටයුතු කළ යුතුයි. |
| (ඈ) | මුදල් එකතු කිරීමේ ක්‍රියාකාරකම් නොමැතිව එක් ආරක්ෂක සේප්පුවක් (Safe Locker) භාවිතයෙන් තොරව නිෂ්ක්‍රීයව පැවතියද නාගරීකරණයේ ජීවත්වන ජනතාව සහිත උප්පුවෙලි උප කාර්යාලය තම මුදල් එකතු කිරීමේ ක්‍රියාකාරකම් ප.ව 4.00 ට සම්පූර්ණ කර සේවා සැපයීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු සපයා නැත. | ප්‍රාදේශීය සභා අරමුදලේ 28 වැනි වගන්තියට අනුව මූල්‍ය ක්‍රියාදාම මගින් ජනතා සේවාවන් වැඩිදියුණු කිරීමට කටයුතු කළ යුතුයි. |

**3.2 මෙහයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2011 සිට 2019 දක්වා දල වශයෙන් පුද්ගලික ඉඩම් 24 ක් අනු බෙදීමේදී ප්‍රාදේශීය සභාවේ මහජන භාවිතය සඳහා වෙන් කරන ලද 10% ප්‍රතිශතය වන 01A 07R 7.29P වපසරියකින් යුතු ඉඩම් ප්‍රාදේශීය සභාව විසින් මේ දක්වා කිසිදු පොදු කටයුත්තක් සඳහා භාවිතා කර නොතිබුණි. | පිළිතුරු සපයා නැත. | මහජන උපයෝගිතා වැඩිදියුණු කර ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතුයි. |

**3.3 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු නමින් පවතින වාහන 16 ක අයිතිය පවරා ඒවායේ වටිනාකම් ගණනය කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු සපයා නැත. | අයිතිය පවරා ගැනීමට පියවර ගත යුතුය. |

**3.4** **මානව සම්පත් කළමනාකරණය**

--------------------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙවන මට්ටමේ අනුමත කාර්ය මණ්ඩලයට වඩා නිලධාරීන් 11 ක අතිරික්තයක් ද නිලධාරීන් 28 ක ඌණතාවයක්ද පැවතුණි. | මේ වන විට සභාවේ සිටින සියලුම ආදේශක සේවකයන් අදාල අමාත්‍යංශ අනුමැතිය මත පත් කර ඇත. | කාර්ය මණ්ඩල වෙනස්වීම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | සභාවේ නිලධාරීන් 40 ක් සිටියද පෞද්ගලික ලිපිගොනු (Personal File) යාවත්කාලීන කර නොමැති අතර වාර්ෂික කාර්ය සාධන ඇගයීම් වාර්තාව නිලධාරීන්ගෙන් ලබා ගෙන නොතිබුණි. | පිළිතුරු සපයා නැත. | වාර්ෂික කාර්ය සාධන ඇගයීම් වාර්තාව ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

**4.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1** **පාරිසරික ගැටලු**

-----------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1988 අංක 56 සහ 2000 අංක 53 පනත් වලින් සංශෝධිත ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ ක්‍රියාත්මක රෙගුලාසිවලට අනුකූලව පාරිසරික බලපත්‍ර ලබා ගතයුතු ආයතන 10 ක් බලපත්‍ර ලබා ගෙන නොතිබුණි. | ආයතනවලට ලිපි මගින් උපදෙස් දී ඇතත් කිසිදු ප්‍රතිචාරයක් ලැබී නැත. කෙසේ වෙතත් සිහි කැඳවීම් ලිපි යවා ඇත. | පාරිසරික බලපත්‍ර නිකුත් කිරීම ක්‍රියාවලිය කඩිනම් කිල යුතුය. |